# සිංහල බුද්ධාගම හා ඊනියා බුද්ධිමත්තු

මෙරට ප්‍රශ්නය අන්කිසිවක් නොව සිංහලයන්ට හා සිංහල බෞද්ධ සංස්කෘතියට හිමිවිය යුතු තැන අභිමිකිරීම බව අප කිහිපවතාවක් ම පවසා ඇත. බටහිර සමාජයීය විද්‍යාඥයන්, හා ඔවුන්ගේ මත උළාකන මෙරට හා පිටරට සිටින බොහෝ සිංහල පවුල්වල උපත ලත් සමාජයීය විද්‍යාඥයන් ප්‍රකාශකරන අදහස නම් මෙරට ප්‍රශ්නවලට ප්‍රධාන හේතුව සිංහල බෞද්ධ ආධිපත්‍යය බව ය. බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ජීවත්වන මේ සමාජයීය විද්‍යාඥයන්ගෙන් යම් පිරිසක් සිංහල සමාජය ගැන යම් යම් හේතු නිසා වෛරයකින් හා ද්වේෂයකින් පසුවන අතර ඔවුහු ද අනෙක් අය ද බටහිර රටවල් විසින් විසිකෙරෙන වරප්‍රසාද, ව්‍යාජ කීර්තිය හා මහාචාර්යකම් වැනි මස්කටු හමුවේ සිංහල ජාතියට විරුද්ධව කටයුතුකරති. එසේත් නැතහොත් සංස්කෘතියෙන් පමණක් නොව ආගමින් ද ක්‍රිස්තියානි වී සිටිති. බටහිර සමාජයීය විද්‍යාවන්, විශේෂයෙන් ම සමාජ විද්‍යාව හා දේශපාලන විද්‍යාව, යනු බංකොළොත් විෂය වෙයි. බටහිර භෞතික විද්‍යාවේ ආකෘතිය පසුපස නොනඩිගසමින් යන මේ විද්‍යාවන්ගෙන් අද ලෝකය තේරුම්ගත හැකි ආකාරයකට නිර්මාණය නො වෙයි. ඒ විෂයන්ගෙන් අද කෙරෙන්නේ බටහිර ක්‍රිස්තියානි ආධිපත්‍යය රැකගැනීමට මතවාද සැපයීම පමණ ය.

අදාළ ප්‍රශ්නය සාකච්ඡාකිරීමට පෙර බටහිර සමාජයීය විද්‍යාවන්ගේ බංකොළොත්බව පෙන්වීමට එක් නිදසුනක් ගනිමු. යම් සංකල්පයක් අර්ථදැක්වීම හෙවත් නිර්වචනයකිරීම බටහිර ගණිතයේ මෙන්ම බටහිර භෞතික විද්‍යාවෙහි ද අදාළ විෂය ක්ෂේත්‍රය ආරම්භයේ දී මෙන් කෙරෙන්නකි. එහි දී යම් සංකල්පයකට නිශ්චිත නිර්වචනයක් දීම බොහෝවිට සිදුකෙරෙන්නකි. එහෙත් එලෙස නිශ්චිත නිර්වචනදීම බටහිර සමාජයීය විද්‍යාවන්හි නො කෙරෙන්නකි. උදාහරණයක් ලෙස ජාතිය යන සංකල්පය ගනිමු. ජාතිය යන්න නිර්වචනයකිරීම විද්‍යුත්චුම්බක ක්ෂේත්‍රය නිර්වචනකිරීම වැන්නක් නො වෙයි. මේ මේ ගුණ සහිත ප්‍රජාවක් ජාතිය යැයි නිර්වචනය කළවිට ඒ ගුණ ඇති ජාතියක් නොවන ප්‍රජාවක් ගැන ද උදාහරණ දීමට හැකි වෙයි. මෙහි ප්‍රතිඵලය වනුයේ ජාතියක් යනුවෙන් මිනිස් එකතුවක් නැතැයි ඇතැම්විට පිළිගැනීම ය. අන්මෙකින් ඔෆ් ද නේෂන් වැනි කෘති බටහිර සමාජයීය විද්‍යාවන්හි පළවන්නේ බටහිර භෞතික විද්‍යාව පසුපස ගොස් නිර්වචන දිරවාගැනීමට බටහිර සමාජයීය විද්‍යාඥයන්ට නොහැකි වී තිබෙන බැවින් ය. බටහිර සමාජයීය විද්‍යාවන්ට අවශ්‍ය නම් නිර්වචනකිරීම පිළිබඳ ව වෙනත් පිළිවෙතක් භාරතයේ ආයුර්වේදය වැනි විද්‍යාවකින් ඉගෙනගත හැකි ය. එහෙත් ඔවුහු එසේ නොකරති. එයට ප්‍රධාන හේතුව බටහිර චින්තනය භාරතීය චින්තනයෙන් වෙනස් වීම ය. බටහිර නිර්වචන ඒකරේඛීය චින්තනය මත පදනම්වන අතර පෙරදිග නිර්වචන චක්‍රීය චින්තනයක් මත පදනම් වෙයි. රේඛීය චින්තනයක හැදෙන වැඩෙන බටහිර සමාජයීය විද්‍යාඥයකුට භාරතීය හා වෙනත් පෙරදිග නිර්වචනවලට හුරුවීමට නො හැකි ය.

මෙරට ඇත්තේ සිංහල බෞද්ධ ආධිපත්‍යයක් යැයි කෑමොර දෙන කසිකබල් උගතුන්ට නො පෙනෙන ප්‍රධාන ම කරුණ නම් මුළු ලෝකය පුරාම ඇති බටහිර රෙපරමාදු ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යය ය. බටහිර ගණිතය හා බටහිර භෞතික විද්‍යාව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි නිර්මාණ වෙයි. මේ පිළිබඳ කෙටි හැඳින්වීමක් විද්‍යා කතන්දර පොතෙහි දැකගත හැකි ය. ඒකරේඛීය නිර්වචනය ම ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට අයත් වුවකි. සියළු ඒකරේඛීය නිර්වචනවල මුල ඇත්තේ නිර්වචනය කළ නොහැකි සංකල්පයකි. බටහිර ජ්‍යාමිතියෙහි තලයක් සරල රේඛා ඇසුරෙන් නිර්වචනය කළ හැකි ය. සරල රේඛාවක් ලක්ෂ්‍ය ඇසුරෙන් නිර්වචනය කළ හැකි ය. එහෙත් ලක්ෂ්‍යයක් නිර්වචනය කරන්නේ කෙසේ ද? ඒකරේඛීය චින්තනයෙහි ලක්ෂ්‍යයක් නිර්වචනය කළ හැක්කේ ලක්ෂ්‍යය, සරල රේඛාව ආදී සංකල්ප ඇසුරු නොකරගනිමින් ය. එහෙත් එසේ නොකළහැකි බැවින් බටහිර ජ්‍යාමිතියෙහි දී ලක්ෂ්‍යය අනිර්වාචිත සංකල්පයක් ලෙස තිබෙන්නට ඉඩහැරෙයි. එනම් ලක්ෂ්‍යය යන්න බටහිර ජ්‍යාමිතියෙහි නිර්වචන නො කෙරෙයි. බටහිර ගණිතයෙහි එවැනි උදාහරණ රාශියක් වෙයි.

එහි මුල ඇත්තේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය ය. දෙවියන්වහන්සේ ලෝකය නිර්මාණයකළ ද, දෙවියන්වහන්සේ කිසිවකු විසින් හෝ නිර්මාණයකෙරී නැත. ලෝකය දෙවියන්වහන්සේ ඇසුරෙන් විස්තර කළ ද දෙවියන්වහන්සේ විස්තර කරන්නේ කෙසේ ද? දෙවියන්වහන්සේ උන්වහන්සේ විසින් මවන ලද දෙයින් විස්තර කළහැකි නො වෙයි. එය ලක්ෂ්‍යයක්, ලක්ෂ්‍යය ඇසුරෙන් නිර්වචනය කෙරුණු සරල රේඛා හා තල ඇසුරෙන් නිර්වචනය කරනු වැනි ය.

© Prof. Nalin De Silva

දෙවියන්වහන්සේ අනිර්වාචිත ය. මේ රේඛීය චින්තනයෙහි ගැටළුවක් මිස අනෙකක් නො වෙයි. අද අප ජීවත්වන්නේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතියෙහි ය. අපේ පාසල්, සරසවි හා ඊනියා අවිධිමත් හෙවත් අනාකෘතික අධ්‍යාපනය (නොන් ෆෝර්මල් යන්න අවිධිමත් යැයි පරිවර්තනය කළ අධ්‍යාපන විශේෂඥයෝ මෙරට සිටිති. බටහිර පාඨමාලා නිර්දේශ අනුව යමින් මෙරට පාඨමාලා නිර්දේශ සකස්කරන මේ මහදැනමුත්තන් අතින් සකස්වෙන අධ්‍යාපනයක් ගැන කියනුම කවරේ ද? මෙරට පාසල් සිසුන්ට දෙවියන්ගේ ම පිහිට ය.) නිර්වචනයේ සිටම මුළුමනින් ම ක්‍රිස්තියානි වෙයි. එහෙත් ඒ බවක් නොදන්නා සමාජයීය විද්‍යාඥයන් යැයි කියාගන්නෝ තමන් ක්‍රිස්තියානි සංස්කෘතික ආධිපත්‍යයෙහි සුවච කීකරු සේවකයන් වෙමින් සිංහල බුද්ධාගමේ ආධිපත්‍යය ගැන කතාකරති.

අප කතාකරන සිංහල බුද්ධාගම ගණනාථ ඔබේසේකරගේ බ්‍රිතානි යුගයේ ඇති වූ සිංහල බුද්ධාගම නො වෙයි. ලෝකයේ කොතැනකවත් බුදුන්වහන්සේගේ බුද්ධාගමක් (බුදු සසුනක්) නැත. ක්‍රිස්තුස්වහන්සේගේ (හෝ ක්‍රිස්තියානි පල්ලි හා කතෝලික පල්ලිය ආරම්භකළ අයගේ) ක්‍රිස්තියානියක් යම් ප්‍රමාණයකට හෝ ලෝකයේ ඇත්තේ ඒ සංස්කෘතියේ ම ඇති ලක්ෂණය නිසා ය. නොපෙනෙන (ඉන්ද්‍රිය ගෝචර නොවන) දෙවියන්වහන්සේ කෙනකු පිළිබඳ විශ්වාසයක් සැමට පොදු අයුරින් රැකගැනීමට උත්සාහකරන ඒ ඒ ක්‍රිස්තියානි ආගම් මුළු ලෝකයට ම පොදු වූ ආගම් පවත්වාගෙන යෑමට කටයුතු කරයි. ඔවුන් අතර විරුද්ධතාවන් ඇති වූ විට ඔවුන් කරන්නේ වෙනම ක්‍රිස්තියානි ආගමක් පිහිටුවීම ය. මාටින් ලූතර්ලා කෙළේ එය ය. එසේ අළුතින් පිහිටුවන ක්‍රිස්තියානියෙහි තවත් බෙදීමක් ඇතිවන තුරු එකම ආගමක් වෙයි. ආරම්භයේ දී දැඩි මධ්‍යස්ථභාවයකින් ක්‍රියාකරන මාක්ස්වාදී සංවිධානවල දෙකඩ තෙකඩවීම් සිදුවන්නේ ද ඒ අයුරින් ය. මාක්ස්වාදය යුදෙව් කතෝලික චින්තනයෙහි බිහිවූවක් බව පෙන්වාදිය හැකි ය.

බුදු සසුන එසේ නො වෙයි. ඒ ඒ රටවල පිහිටුවනු ලැබුයේ ඒ ඒ රටවල බුදු සසුන් මිස බුදුන්වහන්සේගේ හෝ අශෝක රජුගේ හෝ බුදු සසුනක් නො වෙයි. සිංහල බුදු සසුන යනු මිහිඳු හිමියන් විසින් මෙරට පිහිටුවනු ලැබූ බුදු සසුන වෙයි. ඒ බුද්ධාගමක් වූයේ යුරෝපීයන්ගේ පැමිණීමෙන් පසුව ය. ඇමරිකාවේ වෙසෙන මෙරට තුට්ටුදෙකේ සමාජවිද්‍යාඥයකු ඒ බව නොදන්නේ නම් එයට හේතුව ඔහුගේ සමාජවිද්‍යාවේ බංකොළොත්කම මිස අනෙකක් නො වෙයි. ඔහු දන්නේ ලොවට පොදු වූ ක්‍රිස්තියානි ආගම් (නිකාය) ගැන ය. බුදු සසුනේ දෙවියන්වහන්සේ මෙන් ඊනියා නිරපේක්ෂක සත්‍යයන් නොමැති බව ඔහුට කියාදිය හැකි බටහිර සමාජවිද්‍යාඥයකු නැත. මෙරටින් බිහිවී යැයි කියන මහා සමාජවිද්‍යාඥයන්ට ද එවැනි දැනුමක් නිර්මාණයකිරීමට තරම් නිර්මාණශීලීත්වයක් නැත. මේ වද අනුකාරකයන්ට කළහැක්කේ ගෙදර ඇති මුවහමට තඩිබාන්නාක් මෙන් ඕනෑම දෙයකට සිංහල බුද්ධාගමට බැන වැදීම පමණ ය.

පෘතුගීසීන් මෙරටට පැමිණි දා සිට සිදුවන්නේ ක්‍රමයෙන් බටහිර ක්‍රිස්තියානි නූතනත්වය අප මත බලයෙන් පැටවීම හා එයට අනුරූපීව සිංහල බෞද්ධ සංස්කෘතියට හිමි තැන අහිමිකිරීම ය. මේ බටහිර ක්‍රිස්තියානි සංස්කෘතික ආක්‍රමණයට එරෙහිව සිංහල බෞද්ධයන් කළ හා කරණ සෑම ක්‍රියාවක් ම විජාතික බලවේග විසින් අපහාසයට උපහාසයට ලක්කෙරෙයි. එසේත් නැතහොත් ඒ ක්‍රියා සිංහල බෞද්ධ අධිපතිවාදී ක්‍රියා ලෙස විස්තරකෙරෙයි. දැනට අවුරුදු පණහකට පමණ පෙර සිටි කොලට් නම් විජාතික බලවේගයේ විකට චිත්‍ර ශිල්පියා සිංහල බෞද්ධ නායකයන් වඳුරන්ට සමාන කරමින් චිත්‍ර ඇන්දේ ය. බර්ගර් ජනවර්ගයට අයත් වූ මොහු පසුකලෙක ඔහුට සරිලන ඕස්ට්‍රේලියාවේ පදිංචියට ගියේ ය. කතෝලික පල්ලිය පාසල් රජයට පවරාගැනීමේ දී පමණක් නොව නිදහස් අධ්‍යාපන පණත සම්මතකරගැනීමේ දී ද විරුද්ධ විය. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය ආදිය සිංහලයන්ට ලැබුණේ මාක්ස්වාදී සමාජවාදයකින් නොව සිංහල බෞද්ධ සමාජවාදයෙනි. පිරිවෙනෙහි සාමාන්‍ය මිනිසුන්ගේ දරුවෝ නොමිළේ ඉගෙනගත්හ. මිහින්තලේ රෝහලේ කහවණු අයකළ බවට සාක්ෂි නැත. මිහිඳු හිමියන් විසින් පිහිටුවන ලද සිංහල බුදු සසුනට කල් පවත්නා ශක්තියක් ලබාදුන්නේ දුටුගැමුණු රජතුමා ය. ලෝකයේ ම බෞද්ධයනට යුද්ධය අකැප නොවේ යැයි එතුමා ක්‍රියාවෙන් ම පෙන්වා දුන්නේ අවුරුදු දෙදහසකට වැඩි අනාගතයකට අත දිගුකර කිතුවසින් විසිවැනි සියවසේ පහළ වූ බටහිර සමාජයීය විද්‍යාඥයන්ට දරුණු අතුල් පහරක් දෙමින් ය. දුටුගැමුණු රජතුමා එසේ නොකරන්නට මෙරට ස්වෛරීභාවය නැති වී බොහෝ කල් ය. අශෝක බුදු සසුන හා රාජ්‍යය වැඩිකල් නොගොස්ම භාරතයෙන් අතුරුදහන් විය. මෙරට ඒකීයබව (එක්සේසත්බව) රැකුණේ සිංහල බුද්ධාගම ශක්තිමත්වීම නිසා මිස අශෝක බුදු සසුනක් නිසා නොවේ. කුලීකාර උගතුන්ට අවශ්‍ය සිංහල බුදු සසුන හා රටේ ඒකීයබව නැතිකිරීම ය.

© Prof. Nalin De Silva